සියලුම හිමිකම් ඇවිරිණි / All Right Reserved

# විද්‍යාරත්න විද්‍යායතන පිරිවෙන - හොරණ

## පළමු වාර පරීක්ෂණය - 2022

## 1st Term Test 2022 - August

| 10 ශ්‍රේණිය | ව්‍යාපාර හා ගිණුම්කරණය අධ්‍යයනය I | කාලය පැය 3 යි. |
|---|---|---|

### I පත්‍රය

- සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවලට දී ඇති 1, 2, 3, 4, යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් නිවැරදි ගැළපෙන පිළිතුර තෝරන්න.

01. 'ව්‍යාපාර' යන්නට වඩාත් නිවැරදි ව අර්ථකථනය වන්නේ,
    1. ලාභ ලැබීමේ අරමුණින් පොදුවේ පවත්වාගෙන යන පුද්ගලයන් අතර පවත්නා සම්බන්ධතාවය.
    2. අවශ්‍යතා හා වුවමනා සපුරාලිම සඳහා අවශ්‍ය භාණ්ඩ හා සේවා සැපයීමට පුද්ගලයෙකු හෝ පුද්ගල කණ්ඩායමක් හෝ ඒකරාශි වීම.
    3. මිනිස් අවශ්‍යතා සපුරාලීමට අවශ්‍ය විවිධ වූ භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම හෝ සැපයීම හෝ ආශ්‍රිත ආර්ථික කටයුත්තකි.
    4. ඉහත කිසිවක් නොවේ.

02. පහත දැක්වෙන්නේ ව්‍යාපාර හා සම්බන්ධ වගන්ති කිහිපයකි.
    A. පාරිභෝගික තෘප්තිය ඉහළ නැංවීම ව්‍යාපාර අරමුණකි.
    B. මිනිස් අවශ්‍යතා සපුරාගන්නා විවිද ආකාර අවශ්‍යතා වේ.
    C. ස්වභාව ධර්මයෙන් ලැබී ඇති සියළුම සම්පත් ප්‍රාග්ධනය වේ.
    D. තොරතුරු හා සන්නිවේදන ක්ෂේත්‍රයේ වේගවත් වර්ධනය තුළින් ඇති වූ විද්‍යුත් මාධ්‍ය මගින් මුළු ලෝකයට විශ්ව ගම්මානයක් බවට පත් වී ඇත.

    ඉහත ප්‍රකාශ අතරින් නිවැරදි ප්‍රකාශ වනුයේ,
    1. A හා D  2. A හා C  3. C හා D  4. B හා C

03. අවශ්‍යතා හා වුවමනාවල ගති ලක්ෂණවලට අදාළ නිවැරදි ප්‍රකාශය වන්නේ,
    1. අවශ්‍යතා ව්‍යාපාරිකයන්ට නිර්මාණය කළ හැකි ය.
    2. අවශ්‍යතා සෑම පුද්ගලයෙකුට ම අවශ්‍ය ඒවා වේ.
    3. ජීවත්වීම සඳහා සියළු වුවමනා සපුරාගැනීම අත්‍යවශ්‍ය වේ.
    4. වුවමනා සංඛ්‍යාත්මකව ඉතා අඩු ප්‍රමාණයක් වෙති.

04. පහත දැක්වෙන්නේ අවශ්‍යතා හා වුවමනා වලට අදාළ ලක්ෂණ කිහිපයකි,
    A. අත්‍යවශ්‍ය වීම  B. පොදු වීම.
    C. විවිධ වීම  D. නිර්මාණය කළ හැකිවීම
    E. ජනප්‍රිය බේකරිය  F. සීමිත වීම

    ඉහත ලක්ෂණ අතරින් අවශ්‍යතාවයන්ට පමණක් අදාළ වන්නේ,
    1. A, B, C  2. C, D, F  3. B, E, F  4. A, D, F

05. පවතින ආර්ථික අර්බුදය නිසා ඉන්ධන පිරවුම්හල්වල පසුගිය දිනවල දිගු පෝලිම් දක්නට ලැබුණි. ඉහත ඡේදයට අනුව සපුරාගැනීමට උත්සාහ දරන අවශ්‍යතාව හා වුවමනාව වන්නේ,

1. සෞඛ්‍ය - ඖෂධ
2. ප්‍රවාහනය - ඉන්ධන
3. අධ්‍යාපනය - පොත්පත්
4. සන්නිවේදනය - දුරකථන

06. ව්‍යාපාර ආයතන කිපයක නාමයන් පහත දැක්වේ.

A. මියුරු බිම්මල්
B. විමලසිරි ලී මෝල
C. සුපිරි ෆුඩ් සිටි
D. ලක්ප්‍රිය කමියුනිකේෂන්
E. වාසනා රියදුරු පාසල
E. ජනප්‍රිය බේකරිය

ඉහත ආයතනවලින් සේවා සපයන ආයතනවලට නිදසුන් වන්නේ,

1. D, E, F    2. C, D, F    3. B, C, E    4. A, B, F

07. නිෂ්පාදන සාධකවලට අදාළ සාවද්‍ය ප්‍රකාශය වන්නේ,

1. ස්වභාව ධර්මයෙන් ලැබී ඇති සියළු සම්පත් භූමිය වේ.
2. නිෂ්පාදනයේදී ආධාර කර ගන්නා කායික හා මානසික දායකත්වය ශ්‍රමය වේ.
3. නිෂ්පාදනයේදී ආධාර කර ගන්නා මිනිසා විසින් සකසන ලද දෑ ප්‍රාග්ධනය වේ.
4. යම් නිෂ්පාදන ක්‍රියාවලියක් ආරම්භ කර පවත්වාගෙන යාමේ කාර්යය නිෂ්පාදන සාධක වේ.

08. ව්‍යාපාර පිළිබඳ ඇල්මැති පාර්ශවයක් ලෙස රජයේ අරමුණක් නොවන්නේ,

1. ආයෝජනයේ සුරක්ෂිතතාව
2. ලැබිය යුතු බදු ආදායම් නිසි ලෙස ලබාගැනීම
3. රැකියා අවස්ථා උත්පාදනය කිරීම
4. ජාතික නිෂ්පාදිතය වර්ධනය කර ගැනීම

09. ව්‍යාපාර ඇල්මැති පාර්ශවයන් ලෙස අයිතිකරුවන්ගේ අරමුණක් වන්නේ,

1. නිෂ්පාදිත සාධාරණ මිලකට ලබාගැනීම
2. සාධාරණ වැටුප් ලබා ගැනීම
3. ප්‍රමාණවත් ලාභයක් ලැබීම
4. රැකියා අවස්ථා උත්පාදනය කිරීම

10. ව්‍යාපාරයක ආයෝජන පිළිබඳ තිරණ ගැනීම ................................. අරමුණක් වන අතර, අඛණ්ඩ ඇණවුම් ලබාගැනීම .................................... අරමුණක් වේ.
හිස්තැන්වලට ගැළපෙන පිළිතුර පිළිවෙළින්,

1. රජයේ මූල්‍ය ආයතනවල
2. ආයෝජකයන්ගේ සැපයුම් කරුවන්ගේ
3. සේවකයන්ගේ, රජයේ
4. කළමනාකරුවන්ගේ, අයිතිකරුවන්ගේ

11. ව්‍යාපාරයක බාහිර පරිසර සාධක පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,

1. අයිතිකරුවන්, තරඟකරුවන්, සේවකයන්
2. තරඟකරුවන්, ගනුදෙනුකරුවන්, අයිතිකරුවන්
3. සේවකයන්, තරඟකරුවන්, සැපයුම්කරුවන්
4. ගනුදෙනුකරුවන්, තරඟකරුවන්, සැපයුම්කරුවන්

12. තම දක්ෂතාවය හා හැකියාව ප්‍රයෝජනයට ගනිමින් පවරන ලද කාර්යය නිසි ලෙස ඉටුකරන පුද්ගලයන් වන්නේ,

1. සේවකයන්    2. කළමනාකරුවන්    3. අයිතිකරුවන්    4. රජය

13. ඇතැම් ව්‍යාපාර සඳහා ආර්ථික අර්බුදයේ බලපෑම,

1. ශක්තියකි.    2. අවස්ථාවකි.    3. දුර්වලතාවයකි.    4. කිසිවක් නොවේ.

14. මේ දිනවල ව්‍යාපාර පරිසරයේ සිදු වූ සිදුවීම් කිහිපයක් පහත දැක්වේ.

A. භාණ්ඩ හා සේවාවල මිල ගණන් නොකඩවා ඉහළ යාම

B. ඇමරිකානු ඩොලරයේ අගය ඉහළ යාම

C. දේශපාලන නායකත්වයේ වෙනසක් සිදුවීම

D. බැංකු පොලී අනුපාතිකය ඉහළ දැමීම

මේ අතරින් ආර්ථික පරිසර සාධක සඳහා අදාළ නොවන්නේ,

1. A 2. B 3. C 4. D

15. දේශීය ව්‍යාපාර සඳහා ගෝලීය පරිසරයේ හිතකර බලපෑමකි,

1. ගුණාත්මක විදේශීය අමුද්‍රව්‍ය ලබාගත හැකිවීම.
2. දැඩි තරඟකාරීත්වයට මුහුණදීමට සිදුවීම
3. දේශීය සංස්කෘතියේ අයහපත් වෙනස්වීම
4. පුහුණු ශ්‍රමය විදේශීය රටවලට ඇදී යාම

16. ආර්ථික පරිසරයට අයත් සාධක පමණක් ඇතුලත් පිළිතුර වන්නේ,

1. උද්ධමනය, අයවැය, ප්‍රතිපත්ති, ඉතුරුම්
2. ආදායම් ව්‍යාප්තිය, යටිතල පහසුකම්, රැකියා නියුක්තිය
3. රැකියා නියුක්තිය, ජාත්‍යන්තර සබඳතා, ඉතුරුම්
4. රැකියා නියුක්තිය, නීතිරීති, ඉතුරුම්

17. සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

1. යම් රටක රජය විසින් ආර්ථික කටයුතු මෙහෙයවීමේදී අනුගමනය කරන ප්‍රතිපත්ති ව්‍යාපාර සඳ්හා බලපෑම් ඇති කරයි.
2. නීතිරීති හා ඒවා ක්‍රියාත්මක කරන ආයතන නිසා ව්‍යාපාරිකයන්ට සිය අභිමතය පරිදි ව්‍යාපාරික කටයුතු කිරීමේ හැකියාව සීමා වේ.
3. ව්‍යාපාර භාණ්ඩ හා සේවා මිලදී ගන්නා පුද්ගලයෝ තරඟකරුවෝ වේ.
4. ව්‍යාපාරයේ ක්‍රියාකාරීත්වයට බලපාන ව්‍යාපාර පරිසරයක් පරිබාහිරව ක්‍රියාත්මක වන පාර්ශව සහ බලවේග බාහිර පරිසරය වේ.

18. අතීතයේ භාවිතා කළ සාමාන්‍ය තැපැල වෙනුවට දුරකථන, Whatsapp, විද්‍යුත් තැපැල වැනි ක්‍රම ව්‍යාපාර විසින් භාවිතා කිරීම අයත් වන්නේ,

1. දේශපාලන පරිසරය 2. නෛතික පරිසරය
3. ආර්ථික පරිසරය 4. තාක්ෂණික පරිසරය

19. ව්‍යාපාරයකට ඇති අවස්ථා හා තර්ජන සඳහා නිදසුනක් වන්නේ,

1. අධිවේගී මාර්ග ඉදිකිරීම 2. පාරිභෝගිකයන්ගේ ජීවන රටාව වෙනස්වීම
3. ජාත්‍යන්තර වෙළඳ සම්බාධක පැනවීම 4. සේවකයන්ගේ විශේෂ දැනුම හා කැපවීම

20. ආනයන සීමා කිරීම සම්බන්ධව රජය ගත් තීරණය අයත් වන්නේ,

1. ආර්ථික පරිසරය 2. දේශපාලන පරිසරය
3. නෛතික පරිසරය 4. තාක්ෂණික පරිසරය

21. ලාභඅරමුණු කරගත් පෞද්ගලික අංශයේ ව්‍යාපාර සංවිධානයක් නොවන්නේ,

1. සමුපකාර සමිති 2. කේවල ස්වාමි ව්‍යාපාර
3. හවුල් ව්‍යාපාර 4. සංස්ථාපිත සමාගම්

22. පෞද්ගලික අංශයේ ව්‍යාපාර සංවිධාන පමණක් ඇතුලත්වන පිළිතුර වන්නේ,
    1. රාජ්‍ය සංස්ථා, හවුල් ව්‍යාපාර, සමිති සංවිධාන
    2. හවුල් ව්‍යාපාර, සංස්ථාපිත සමාගම්, සමූපකාර සමිති
    3. හවුල් ව්‍යාපාර, සංස්ථාපිත සමාගම්, රාජ්‍ය සමාගම්
    4. රාජ්‍ය දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා, රාජ්‍ය සමාගම්

23. පරිමාණය අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කිරීම සඳහා භාවිතා කරන නිර්ණායක වන්නේ,
    1. ව්‍යාපාරයේ ප්‍රාග්ධන ප්‍රමාණය    2. සේවක සංඛ්‍යාව
    3. භාවිතා කරන බලශක්තිය ප්‍රමාණය    4. ඉහත සියල්ල ම

24. කේවල ස්වාමි ව්‍යාපාරයක ලියාපදිංචි කිරීමේ බලධාරියා වන්නේ,
    1. සමාගම් රෙජිස්ටාර්වරයා    2. මහජන සෞඛ්‍ය පරීක්ෂක
    3. පළාත් සභාවේ ව්‍යාපාර නාම රෙජිස්ටාර්වරයා 4. ප්‍රදේශීය සභාවේ සභාපති

25. ඒක පුද්ගල ව්‍යාපාරයක ලක්ෂණයක් නොවේ,
    1. ප්‍රාග්ධනය තනි පුද්ගලයෙකු විසින් යෙදවීම 2. නීතිමය පුද්ගලභාවයක් තිබීම
    3. අයිතිකරුගේ වගකීම අසීමිත වීම    4. අඛණ්ඩ පැවැත්මක් නොමැති වීම

26. හවුල් ව්‍යාපාරයක උපරිම හවුල්කරුවන් සංඛ්‍යාව තීරණය කරනුයේ,
    1. 1890 හවුල් ආඥා පනතට අනුව
    2. 1840 අංක 07 දරණ වංචා වැළැක්වීමේ ආඥා පනත
    3. 1972 අංක 5 දරණ සමූපකාර සමිති පනත අනුව
    4. 2007 අංක 7 දරණ සමාගම් පනත අනුව

27. 1840 අංක 7 දරණ වංචා වැළැක්වීමේ ආඥාපනතින් අදහස් වන්නේ,
    1. ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීම අනිවාර්යය වේ.
    2. හවුලක ආරම්භක ප්‍රාග්ධනය රු. 1000 කට වැඩි නම් එය ලිඛිත ගිවිසුමකින් ආරම්භ කළ යුතු ය.
    3. සමාගම්වල ගිණුම් කටයුතු පවත්වාගෙන යා යුතු ය.
    4. හවුල් ව්‍යාපාරයක් ආරම්භ කර පවත්වාගෙන යා යුතු ආකාරය හා විසුරුවා හැරීම සිදුකරන ආකාරය.

28. පහත දක්වෙන ව්‍යාපාර නාම අතරින් හවුල් ව්‍යාපාරයක් ලෙස හඳුනාගත හැක්කේ,
    1. සීමාසහිත නන්ද සමාගම    2. ජනහිත ස්ටෝර්ස්
    2 සිල්වා සහ පුත්‍රයෝ    4. සිලිමල මණ්ඩලය

29. තනිපුද්ගල ව්‍යාපාරයක ප්‍රාග්ධනය සපයනු ලබන්නේ,
    1. අයිතිකරුවන්    2. හවුල්කරුවන්    3. කොටස්කරුවන්    4. සාමාජිකයින්

30. තනි පුද්ගල ව්‍යාපාරයක් හා සැසැඳීමේදී හවුල් ව්‍යාපාරයක වාසියක් වන්නේ,
    1. වගකීම අසීමිත වීම    2. වගකීම හවුල්කරුවන් අතර බෙදීයාම
    3. නීතිමය පුද්ගලභාවයක් නොමැතිවීම    4. අඛණ්ඩ පැවැත්මක් නොතිබීම

31. ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් පැවතිම යන ලක්ෂණය සහිත ව්‍යාපාර සංවිධාන වර්ගය වන්නේ,
    1. සමූපකාර සමිති    2. රාජ්‍ය සංස්ථා    3. හවුල් ව්‍යාපාර    4. රාජ්‍ය සමාගම්

32. සමාජ සුබසාධනය, සාමාජික සුබසාධනය, ප්‍රජා සේවා ආදී පදනම් කරගත් ව්‍යාපාර සංවිධාන වන්නේ,
  1. සමූපකාර  2. රාජ්‍ය සංස්ථා  3. රාජ්‍ය දෙපාර්තමේන්තු  4. සමිති

33. පහත සංවිධාන අතරින් නීතිමය පුද්ගලභාවයක් නොමැති ව්‍යාපාර සංවිධාන ව්‍යුහය වන්නේ,
  1. රාජ්‍ය සංස්ථා  2. රාජ්‍ය දෙපාර්තමේන්තු
  3. සංස්ථාපිත සමාගම්  4. සමුපකාර

34. පහත X තීරුවේ ව්‍යාපාර සංවිධාන වර්ග හා Y තීරුවේ ඒවායේ ලක්ෂණ කිහිපයක් දක්වේ.

| X | Y |
|---|---|
| 1. හවුල් ව්‍යාපාර | A. තීරණ ගැනීමේ ස්වාධීන බව |
| 2. ඒක පුද්ගල ව්‍යාපාර | B. උපරිම සාමාජික සංඛ්‍යාව 20 |
| 3. සමිති සංවිධාන | C. කොටස් ප්‍රාග්ධනය රැස් කිරීම |
| 4. සංස්ථාපිත සමාගම් | D. සාමාජික සුබසාධනය අරමුණ වේ. |

ඉහත X තීරුව හා Y තීරුව සමග ගැලපූ විට නිවැරදි පිළිතුර වන්නේ,
  1. BADC  2. ABCD  3. CDBA  4. BCAD

35. පූර්ණ රාජ්‍ය හිමිකාරත්වය සහිත ව්‍යාපාර වනුයේ,
  1. රාජ්‍ය සමාගම්  2. රාජ්‍ය දෙපාර්තමේන්තු
  3. සංස්ථාපිත සමාගම්  4. රාජ්‍ය සංස්ථාව

36. පහත ඒවායෙන් රාජ්‍ය සංස්ථාවක් නොවන්නේ,
  1. ශ්‍රී ලංකා විදුලි බල මණ්ඩලය  2. ශ්‍රී ලංකා වරාය අධිකාරිය
  3. ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව  4. කෘෂි රක්ෂණ මණ්ඩලය

37. රාජ්‍ය දෙපාර්තමේන්තු සඳහා අවශ්‍ය අරමුදල් සම්පාදන කරනු ලබන්නේ,
  1. හවුල්කරුවන්ගේ ලබාදෙන මුදල් මගින්
  2. කොටස් නිකුතුවෙන් ලබාගන්නා මුදල් මගින්
  3. රාජ්‍ය වාර්ෂික අයවැය ලේඛනය මගින් වෙන්කරන මුදල්
  4. සාමාජිකයන්ගෙන් ලබාගන්නා සාමාජික ගාස්තු මගින්.

38. යෝග්‍ය ව්‍යාපාර සංවිධාන ක්‍රමයක් තෝරා ගැනීමේදී සලකා බලන සාධක වන්නේ,
  1. අරමුණු  2. පරිමාණය  3. කළමනාකරණය  4. ඉහත සියල්ලම

39. ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීමෙන් ලබාගත හැකි ප්‍රයෝජනයක් නොවන්නේ,
  1. නෛතික පුද්ගලභාවය හිමිවීම  2. අනන්‍යතාවයක් ලැබීම
  3. ව්‍යාපාර නාමයේ අයිතිය තහවුරු වීම  4. ණය ලබාගැනීමේදී පහසුවක් ලැබීම

40. ඒක පුද්ගල ව්‍යාපාරයක් ආරම්භකර ලියාපදිංචිය සඳහා අයදුම්පත ඉදිරිපත් කළ යුතු වන්නේ,
  1. දින 7 ක් ඇතුලත  2. දින 14 ක් ඇතුලත
  3. දින 21 ක් ඇතුලත  4. දින 28 ක් ඇතුලත

සියලුම හිමිකම් ඇවිරිණි / All Right Reserved

# විද්‍යාරත්න විද්‍යායතන පිරිවෙන - හොරණ

## පළමු වාර පරීක්ෂණය - 2022

## 1st Term Test 2022 - August

| 10 ශ්‍රේණිය | ව්‍යාපාර හා ගිණුම්කරණය අධ්‍යයනය II | කාලය පැය 3 යි. |
|---|---|---|

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

01. සුනිල් තම පාසල් අධ්‍යාපනය අවසන් කර පරිගණක ආශ්‍රිත ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. කුඩා කාලයේ සිටම නිර්මාණාත්මක හැකියාවන් වලින් යුක්ත වූ සුනිල් පරිගණක ආශ්‍රිත පාඨමාලා කිහිපයක් ඒ වන විටත් අවසන් කර තිබුණි. තමාගේ වැඩිමහල් සහෝදරයා ද මේ වන විටත් පරිගණක නිර්මාන කටයුතු ආශ්‍රිත රැකියාවක නිරත වෙමින් සිටින අතර ඔහුද තමන්ගේ ම ව්‍යාපාරයක් ආරම්භ කිරීමට බලාපොරොත්තුවෙන් සිටී.

    i. සුනිල් ආරම්භ කිරීමට බලාපොරොත්තු වන ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක්ද?
    ii. එම ව්‍යාපාරය ලියාපදිංචි කිරීම අනිවාර්යය ද? පැහැදිලි කරන්න.
    iii. සුනිල්ට ඇති ව්‍යාපාරික අවස්ථා දෙකක් ලියන්න.
    iv. ව්‍යාපාර ලියාපදිංචි අවස්ථා දෙකක් ලියන්න.
    v. සුනිල් හට ඇතිවිය හැකි අවාසිදායක තත්ත්වයන් මොනවාද?
    vi. සුනිගේ ව්‍යාපාරයට සොහොයුරා සම්බන්ධ කරගත හොත් ඇතිවිය හැකි ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක්ද?
    vii. එසේ වුවහොත් ඇතිවන වාසිදායක තත්ත්වයන් දෙකක් ලියන්න.
    viii. තවදුරටත් ව්‍යාපාරය නීතිමය පුද්ගලභාවයක් සහිත වීමට නම් කුමන ව්‍යාපාර සංවිධානයක් ආරම්භ කළ යුතු ද?
    ix. සුනිල් තනිවම ව්‍යාපාරය පවත්වාගෙන යන්නේ නම් ඇතිවන වාසිදායක තත්ත්වයන් දෙකක් ලියන්න.
    x. සුනිල්ගේ ව්‍යාපාරයේ ශක්තීන් දෙකක් ලියන්න.

02. i. අ. ව්‍යාපාරයක් යනු කුමක්ද?
    ආ. ව්‍යාපාරික අරමුණු දෙකක් ලියන්න.

    ii. පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.
    අ. සේවක සුබසාධනය ව්‍යාපාර අරමුණක් නොවේ
    ආ. නිර්මාණය කළ නොහැකිවීම වුවමනාවල ලක්ෂණයකි.
    ඇ. ජීවත්වීම සඳහා අවශ්‍යතා සපුරාගැනීම අත්‍යවශ්‍ය නොවේ.
    ඈ. සේවකයන් තෘප්තිමත් කිරීමට වැටුපට අමතරව වෙනත් සුබසාධන කටයුතු සිදුකළ යුතුය.

    iii. පහත දක්වෙන්නේ මිනිස් අවශ්‍යතා කිහිපයකි.

| | |
|---|---|
| 1. ආහාර | 2. ඇඳුම් පැළඳුම් |
| 3. සෞඛ්‍ය | 4. සන්නිවේදනය |

    අ. ඉහත එක් එක් අවශ්‍යතාව සපුරාගත හැකි වුවමනාව බැගින් ලියන්න.
    ආ. අවශ්‍යතා හා වුවමනා අතර වෙනස්කම් දෙක බැගින් ලියන්න.

iv. අ. භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාර යන්න හඳුන්වන්න.
ආ. භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාර සඳහා නිදසුන් හතරක් ලියන්න.

03. i. ව්‍යාපාර පරිසරය යනු කෙටියෙන් හඳුන්වන්න.
ii. පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.
අ. භාණ්ඩ හා සේවාවල මිල මට්ටම අඛණ්ඩව ඉහළ යාම ආර්ථික පරිසර සාධකයකි.
ආ. යටිතල පහසුකම් සංවර්ධන ප්‍රතිපත්ති අයවැය ප්‍රතිපත්ති නෛතික පරිසරයට අයත් වේ.
ඇ. බැංකු පොලී අනුපාතිකය වැඩිවන විට ව්‍යාපාරිකයන් ණය ගැනීම සීමා කරයි.
ඈ. ව්‍යාපාරයක බාහිර පරිසරය අධ්‍යයනයෙන් එම ව්‍යාපාරයේ ශක්තීන් හා දුර්වලතා හඳුනාගත හැක.
iii. අ. පාරිභෝගිකයින් ආරක්ෂා කිරීමට රජය පිහිටුවා ඇති ආයතන දෙකක් නම් කරන්න.
ආ. එම නීති ක්‍රියාත්මක කිරීමට ඇති තනතුරු දෙකක් ලියන්න.
iv. තොරතුරු සන්නිවේදන තාක්ෂණය දියුණුව හේතුවෙන් අද මුළු ලෝකයම විශ්ව ගම්මානයක් බවට පත් ව ඇත.
අ. දේශීය ව්‍යාපාර සඳහා ගෝලීය පරිසරයෙන් සිදුවන හිතකර බලපෑම් දෙකක් ලියන්න
ආ. නූතනයේ බහුලවම ව්‍යාපාර කටයුතු සඳහා භාවිතා කරන විද්‍යුත් ක්‍රමවේද 4 ක් ලියන්න.

04. i. අ. ව්‍යාපාර සංවිධාන යනු හඳුන්වන්න.
ආ. ව්‍යාපාර සංවිධාන වර්ග කළ හැකි ආකාර දෙකක් ලියන්න.
ii. පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද හන්න සඳහන් කරන්න.
අ. ලොව සෑම රජකම බහුලවම දක්නට ලැබෙන්නේ ඒක පුද්ගල ව්‍යාපාර වේ.
ආ. හිමිකරුගේ කැපවීම හා දක්ෂතාවය අනුව ඒක පුද්ගල ව්‍යාපාර සාර්ථක වේ.
ඇ. සීමාසහිත සමාගමක් මූල්‍ය සම්පාදනය කරගන්නා එකම ක්‍රමය කොටස් නිකුත් කිරීමය.
ඈ. ස්වභාව ධර්මයාගෙන් ලැබී ඇති සියළුම දේවල් ප්‍රාග්ධනය ලෙස හැඳින්වේ.
iii. අ. සමූපකාර සමිතිවල ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් පැවතීම යන ලක්ෂණය කෙටියෙන් පැහැදිලි කරන්න.
ආ. සමූපකාර සමිති සඳහා උදාහරණ හතරක් ලියන්න.
iv. ''හවුල් ව්‍යාපාරයක් ඇරඹීමට අවම සාමාජිකයන් දෙකක් හා උපරිමය සාමාජිකයන් 20 ක් සිටිය යුතුය''
අ. හවුල් ව්‍යාපාර වලටද ඇති ගණන සඳහන් කරන්න.
ආ. හවුල් ව්‍යාපාරයක උපරිම සාමාජික සංඛ්‍යාව තිරණය කරන පනත කුමක්ද?

05. i. අ. රාජ්‍ය දෙපාර්තමේන්තු යන්න හඳුන්වන්න.
ආ. රාජ්‍ය දෙපාර්තමේන්තු සඳහා උදාහරණ හතරක් ලියන්න.
ii. පහත ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න සඳහන් කරන්න.
අ. රාජ්‍ය දෙපාර්තමේන්තුවලට නෛතික පුද්ගලභාවයක් ඇත.
ආ. රාජ්‍ය සංස්ථා පොදු හෝ විශේෂ පනතක් යටතේ ආරම්භ කරනු ලබයි.

ඇ. ලංකා විදුලිබල මණ්ඩලය රාජ්‍ය සංස්ථාවක් නොවේ.
ඈ. රාජ්‍ය සංස්ථාවක ලාභයෙන් කොටසක් රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කරයි.
iii. අ. නෛතික පුද්ගලභාවය ව්‍යාපාරයට හිමිවීමෙන් ව්‍යාපාර නාමය භාවිත කිරිමක් සිදුකළ හැකි කාර්යයන් දෙකක් ලියන්න.
ආ. නෛතික පුද්ගලභාවය හිමි නොවන ව්‍යාපාර සංවිධාන දෙකක් ලියන්න.
iv. අ. ව්‍යාපාර සංවිධාන හිමිකාරිත්වය අනුව වර්ග කර රූප සටහනක් අඳින්න.
ආ. ව්‍යාපාර සංවිධාන පරිමාණය අනුව වර්ග කරන්න.